**නිපුණතාව 1.0 :** සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 1.1 :** මව්පිය ගුණ වරුණ ගී ගායනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම 1.1.1 :** ***මව්පිය ගුණ වරුණ ගී ගායනය***

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 හා ,03 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම 01

i. පහත සබැඳිය ඔස්සේ අම්මා සඳකි, සියක් ආයු ලැබ, ආදරයේ උල්පත වූ අම්මා, දූනුකෙයියා මලක් වගේ යන ගීත ශ්‍රවණය කරන්න.

https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=9333&lang=en

ii. ඒවායෙහි ගී පදමාලා නිවැරදිව අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.



iii. ස්වර වාද්‍ය භාණ්ඩයක් ආධාර කර ගනිමින් හෝ ඉහතින් ඔබට ලබා දී ඇති link ආධාරයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීත ගායනයට හුරු වන්න.

පැවරුම 02 (ලිඛිත)

i. මව්පිය ගුණ වර්ණනා කරමින් දරු පරපුරට ආදර්ශමත් අදහස් ප්‍රකාශ කරන්නා වූ පදමාලා ඇතුළත් ගීත විශාල ප්‍රමාණයක් මේ වන විට ශ්‍රව්‍ය/දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වන බව බොහෝ දෙනා දන්නා කරුණකි. විෂය නිර්දේශය තුළදී මේ පිළිබඳ ඔබ ලබා ගත් දැනුමත්, ගීත රසවින්දනය ආදී ස්ව අධ්‍යයන තුළින් රැස් කර ඇති තොරතුරුත් පාදක කොට පහත වගුව සම්පූර්ණ කරන්න.

| මව් ගුණ ගීත 5ක් ලියන්න. | පිය ගුණ ගීත 5ක් ලියන්න. | මව්පිය ගුණ ගී ගයන ගායක /ගායිකාවන් |
|---|---|---|
| 1 | 1 | 1 |
| 2 | 2 | 2 |

ii. "ආදරයේ උල්පත වූ අම්මා"ගී පදමාලාවේ ධ්වනිතාර්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

පැවරුම 03

i. මව්ගුණ පිළිබඳ කියැවෙන ගීත, පදමාලා එක් කොට පොත් පිංචක් නිර්මාණය කරන්න.


සැකසුම - W.N.ගයානි චන්ද්‍රකාන්ති - ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය